# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1145/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 12/07/2024<br>පැය 1545 |

**මාධ්‍ය නිවේදනය**

**තෙල්වත්ත, තොටගමුව රත්පත් රජමහා විහාරස්ථානයේ වාර්ෂික පෙරහැර හේතුවෙන් රථ වාහන ගමනාගමනය සීමා කිරීම - මීටියාගොඩ පොලිස් වසම**

මීටියාගොඩ පොලිස් වසමේ තෙල්වත්ත, තොටගමුව රත්පත් රජමහා විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන මිහිඳු මහා පෙරහර 2024.07.13 වන දින උත්කර්ෂවත් අන්දමින් වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

ඒ අනුව මෙම පෙරහර 2024.07.12 වන දින පස්වරු 01.00 ට විහාරස්ථානයෙන් ගමන් ආරම්භ කර තෙල්වත්ත හන්දියෙන් ගාල්ල-කොළඹ ප්‍රධාන මාර්ගයට ප්‍රවිශ්ඨ වී ගාලු පාර ඔස්සේ වැරැල්ලාන ඉන්ධනහල දක්වා ගමන් කර එම මාර්ගය ඔස්සේම විහාරස්ථානයට පැමිණීමට නියමිතයි.

ඉහත මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන් පහත සඳහන් විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

- කොළඹ දෙස සිට ගාල්ල දෙස දක්වා ගමන් ගන්නා වාහන අම්බලන්ගොඩ පොලිස් වසමේ කහව හන්දියෙන් වමට හරවා මීටියාගොඩ,කිරලගහවෙල , අළුත්වල සරණ හන්දියෙන් දකුණට හැරී ගෝනපීනුවල හරහා කුමාරකන්ද හන්දියෙන් ගාලු පාරට පිවිසීමට හැකියාව ඇත.
- ගෝනාපිනුවල හික්කඩුව මාර්ගයේ හික්කඩුව නගරයෙන් ගාලු පාරට පිවිසීමට හැකි අතර ගාල්ල දෙස සිට කොළඹ දෙසට ගමන් කරනු ලබන වාහන පෙර පරිදි ගාලු පාරේ ගමන් කිරීමට හැකියාව ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**